# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/04 - 2022 ජූලි මස 18 වැනි සඳුදා - 2022.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ අංක 04, සාස්ත්‍රිකුලාන්කුලම් කොට්ඨාසයට තේරී පත් වූ පෙරුමාල් රාමක්‍රිෂ්ණන් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වුද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ අංක 04, සාස්ත්‍රිකුලාන්කුලම් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අන්තෝනි තාවිදු නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, ජේසුදාසන් ජෙනිටන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින් අන්තෝනි තාවිදු, වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ අංක 04 සාස්ත්‍රිකුලාන්කුලම් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ජේ. ජෙනිටන්,**
තේරීම්භාර නිලධාරී,
වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාව.

2022 ජූලි මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
වවුනියාව.

EOG 07 - 0077

1A - G 37082 — 16 (2022/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*